# වාණිජ ධාරා

## වාණිජ විෂයය ගුරුසිසු අත්වැල

(අධ්‍යාපන කාර්යාලය - බළන්ගොඩ)

# ගිණුම්කරණය - 33

## නිපුණතාව 01

ගිණුම්කරණය හා එහි අවශ්‍යතාව විග්‍රහ කරයි.


අනුශාසකත්වය : සුනිල් රාජපක්ෂ මහතා

සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ වාණිජ

සම්පත් දායකත්වය : ගාමිණී හරිස්චන්ද්‍ර මයා

ර/ විද්‍යාලෝක මධ්‍ය මහා විද්‍යාලය



වාණිජ විෂයන් සඳහා ඉගෙනුම් ආධාරක ගොනු සැකසීමේ ව්‍යාපෘතිය

*ගිණුම්කරණය හා එහි අවශ්‍යතාව විග්‍රහ කරයි*

| නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් ඵල |
|---|---|---|
| 1.1 ආයතනයක් කෙරෙහි ඇල්මක් දක්වන පාර්ශ්වයන්ට තීරණ ගැනීම සඳහා ගිණුම්කරණ තොරතුරු වැදගත්වන ආකාරය විග්‍රහ කරයි | • ගිණුම්කරණය හැඳින්වීම<br>• ගිණුම්කරණයේ අවශ්‍යතාව<br>• ආයතනය කෙරෙහි ඇල්මක් දක්වන පාර්ශ්ව හා ඒ ඒ පාර්ශ්වයන්ගේ තොරතුරු අවශ්‍යතා<br>• ගිණුම්කරණයේ ප්‍රභේද හා වෙනස්කම්<br>• මූල්‍ය ගිණුම්කරණය<br>• කළමනාකරණ ගිණුම්කරණය | • ගිණුම්කරණය යන්න පැහැදිලි කරයි.<br>• ගිණුම්කරණයේ අරමුණ පැහැදිලි කරයි.<br>• ආයතනය කෙරෙහි ඇල්මක් දක්වන පාර්ශ්ව නම් කරයි.<br>• ආයතනයට ඇල්මක් දක්වන පාර්ශ්වයන්ට තීරණ ගැනීම සඳහා තොරතුරු අවශ්‍යතා වගු ගත කරයි.<br>• ගිණුම්කරණයේ ප්‍රභේද දක්වා, එම ප්‍රභේද පැහැදිලි කරයි. |
| 1.2 ගිණුම්කරණ පරිසර සාධකවල වෙනස්වීම් මත ගිණුම්කරණයේ වෙනස්වීම් හා ප්‍රවණතා සිදුවන ආකාරය විග්‍රහ කරයි | • ගිණුම්කරණ පරිසරය හැඳින්වීම<br>• ගිණුම්කරණ පරිසර සාධක<br>• ආර්ථික හා දේශපාලන පරිසරය<br>• ශිල්පීය හා වෘත්තීය පරිසරය<br>• නෛතික පරිසරය<br>• සමාජයීය සහ සංස්කෘතික පරිසරය<br>• තාක්ෂණික පරිසරය<br>• ගිණුම්කරණ පරිසර සාධකවල වෙනස් වීම් ගිණුම්කරණයට සිදු කරන බලපෑම | • ගිණුම්කරණ පරිසරය පැහැදිලි කරයි.<br>• ගිණුම්කරණ පරිසර සාධක නම් කර, පැහැදිලි කරයි.<br>• ගිණුම්කරණ පරිසර සාධකවල වෙනස්වීම් ගිණුම්කරණ ක්‍රියාවලියට බලපාන ආකාරය දක්වයි. |

# ගිණුම්කරණය හැඳින්වීම

**සංකල්ප සිතියම**



## ඇමරිකානු ගිණුම්කරණ සංගමය හා ඇමරිකානු පොදු සහතිකලත් ගණකාධිකරණ ආයතනය ගිණුම්කරණය නිර්වචනය කර ඇති ආකාරය.

### ඇමරිකානු ගිණුම්කරණ සංගමය

(American Accounting Association)

“ තොරතුරු ප්‍රයෝජනයට ගන්නා පාර්ශවවලට විනිශ්චයක් කිරිමටත් , තීරණ ගැනීමටත් හැකිවන අයුරින් ආර්ථික තොරතුරු හඳුනා ගැනීමේ , මැනීමේ හා සන්නිවේදනය කිරීමේ ක්‍රියාවලිය ගණුම්කරණයයි “

### ඇමරිකානු පොදු සහතිකලත් ගණකාධිකරණ ආයතනය

(American Institute of Certified Public Accountants)

“යටත් පිරිසයින් අර්ධ වශයෙන් වත් මූල්‍ය ස්වරූපයක් ගන්නා ගනුදෙනු හා සිද්ධි සුවිශේෂී ආකාරයට මුදල් මාධ්‍ය උපයෝගී කරගෙන සටහන් කිරීමේ, වර්ග කිරීමේ, සාරාංශ කිරීමේ සහ ක්‍රියාදාමයේ ප්‍රතිඵලය විවරණය කිරීමේ කලාව ගිණුම්කරණයයි“

- ඉදිරිපත් කර ඇති නිර්වචන ඇසුරින් පොදු නිර්වචනයක් වන්නේ

> ඇල්මක් දක්වන පාර්ශවයන්ට තීරණ ගැනිම සඳහා ගිණුම්කරණ ඒකකයට අදාල ආර්ථිකමය තොරතුරු ලබාදීමේ ක්‍රියාවලිය ගිණුම්කරණයයි

- ඉහත නිර්වචන වලට අනුව ගිණුම්කරණය තුලින් අවධාරණය කරන අනාවරණයන් ලෙස

1. ගිණුම්කරණය ක්‍රියාවලියකි
2. ගිණුම්කරණය ක්‍රියාවලියේ නිමවුම තොරතුරු වේ
3. එම තොරතුරු විවිධ තීරණ ගැනිම සඳහා යොදා ගනී
4. තොරතුරු ඒ ඒ ව්‍යාපාර ඒකකයට අදාලව වෙන වෙනම හඳුනා ගත හැකිවේ.

## ගිණුම්කරණයේ අවශ්‍යතාව/ අරමුණු

- ඇල්මක් දක්වන පාර්ශවයන්ට තොරතුරු ලබාදීම
- ව්‍යාපාරයේ සම්පත් පාලනය
- සේවා නියුක්තිය ඉහල යාම
- ආර්ථික වර්ධනය හා සංවර්ධනය
- සමස්ත සමාජයේම ජීවන තත්ත්වය ඉහල යාම


## ආයතනයේ ඇල්මක් දක්වන පාර්ශව හා ඒ ඒ පාර්ශවයන්ගේ තොරතුරු වල අවශ්‍යතා

| පාර්ශවයන් | තොරතුරු අවශ්‍යතාවයන් |
|---|---|
| ආයෝජකයින්/අයිතිකරුවන් | • ආයෝජනයේ ඵලදායිතාව හා සුරක්ෂිතතාව<br>• තවදුරටත් ආයෝජනය කරන්නේද |
| ණය සැපයුම්කරුවන්<br>ණයහිමියන් | • සපයා ඇති ණයවල සුරක්ෂිත තාව හා තවදුරටත් ණය සපයන්නේද?<br>• ණය පියවීමේ කාලය<br>• ණය ආපසු ලබාගැනීමේ හැකියාව |
| මූල්‍ය ආයතන | • දෙන ලද ණය අයකර ගැනීමේ හැකියාව සොයා බැලීම<br>• තවදුරටත් ණය සපයනවාද යන්න සොයා බැලීම |
| රජය | • ලැබිය යුතු බදු ආදායම් අයකර ගැනීම<br>• රැකියා අවස්ථා සම්පාදනය කිරීමේ හැකියාව සොයා බැලීම<br>• ජාතික නිෂ්පාදිතයේ වර්ධනය / දායකත්වය සොයා බැලීම |
| කළමණාකරුවන් | • අරමුණු ඉටුකිරීමට අවශ්‍ය තීරණ ගැනීම ක්‍රියාත්මක කිරීම<br>• අනාගත සැලසුම් සකස් කිරීම |
| විභව ආයෝජකයන් | • සුදුසු ආයෝජන අවස්ථා හඳුනා ගැනීම |
| සේවකයන් | • රැකියාවේ සුරක්ෂිතතාව<br>• සාධාරණ වැටුප් ලබා ගැනීම |
| පාරිභෝගිකයන් | • සපයන භාණ්ඩවල ගුණාත්මක බව, මිල, අඛණ්ඩව ලබා ගැනීමේ හැකියාව |
| මහජනතාව | • රැකියා අවස්ථා, සමාජ සුභසාධනය |

## ගිණුම්කරණයේ අරමුණු

ගිණුම්කරණ ඒකකය පිළිබඳ උනන්දුවක් දක්වන පාර්ශවයන්ට තීරණ ගැනීම සඳහා අවශ්‍ය වන්නාවූ ආර්ථීක තොරතුරු සන්නිවේදනය කිරීම ගිණුම්කරණයේ ප්‍රධාන අරමුණ වේ.


### ගිණුම්කරණ ඒකක




පුද්ගලයෙක්,රජයක්,ව්‍යාපාර සංවිධානයක්,ව්‍යාපාරයක් හෝ ඕනෑම කටයුත්තක් ව්‍යාපාර ඒකකයක් විය හැකිය.

## තොරතුරු

දැනුම වැඩි කරගැනීමට ඉවහල් වන ඕනෑම දෙයක් තොරතුරු වේ.




( මුදලින් මැනිය හැකි ) ( මුදල් නොවන වෙනත් ඒකක වලින් ප්‍රකාශ කල හැකි )


තීරණ ගැනීම සඳහා ඉහත සියළුම තොරතුරු අදාල වේ.එම තත්ත්වයන් අවබෝධ කර ගැනීම සඳහා පහත තොරතුරු අධ්‍යයනය කරමු.

සාරංග සුපර් සිටි සමාගමේ 2020/03/31 දිනෙන් අවසන් වසර සඳහා පහත තොරතුරු අදාල වේ.

- ව්‍යාපාරික නාමය "සාරංග සුපර් සිටි"
- කාර්ය මණ්ඩලය 25 කි.මින් දෙදෙනකු කළමනාකරුවන් ලෙස කටයුතු කරයි.
- පාරිභෝගික භාණ්ඩ සිල්ලර වෙළඳාමේ යෙදෙන ව්‍යාපාරයකි.
- වර්ෂයේ මුළු විකිණුම් රුපියල් මිලියන 80 වකි.
- වර්ෂයේ මුළු මෙහෙයුම් වියදම් රු.මිලියන 55 කි.
- ප්‍රාග්ධනය ලෙස සාරංග රු.මිලියන 50ක වත්කම් ආයෝජනය කර ඇත.
- මුළු ණය රු.මිලියන 30 කි.
- රජයට ගෙවූ VAT රු.මිලියන 5කි.
- සේවක අර්ථ සාධක අරමුදලට (EPF) ගෙවූ දායකය රු.මිලියන 2කි.
- ව්‍යාපාරය විසින් අළෙවිකරණ විදුලි උපකරණ සඳහා වසර 2ක වගකීම් සහතිකයක් නිකුත් කෙරේ.
- කාලච්ඡේදයට අදාල ලාභය මිලියන 20 කි.

ඉහත සාරංග සුපර් සිටි සමාගමේ 2020 වර්ෂයට අදාලව පහත දී ඇති තොරතුරු වර්ගීකරණයට අනුව පහත වගුව සම්පූර්ණ කරන්න.

| ප්‍රමාණාත්මක තොරතුරු | | ප්‍රමාණාත්මක නොවන තොරතුරු |
|---|---|---|
| මූල්‍යමය | මූල්‍යමය නොවන | |
| | | |



ආයෝජකයින්/
අයිතිකරුවන්
පාරිභෝගිකයන්/
මහජනතාව
ණය සැපයුම්කරුවන්/
ණයහිමියන්
shop
ව්‍යාපාරය
සේවකයන්
මූල්‍ය ආයතන
විභව ආයෝජකයන්
කළමනාකරුවන්
රජය

# ගිණුම්කරණයේ ප්‍රභේද

- ගිණුම්කරණයේ ප්‍රභේද දෙකකි

1. මූල්‍ය ගිණුම්කරණය
2. කළමනාකරණ ගිණුම්කරණය

- **මූල්‍ය ගිණුම්කරණය**

යම්කිසි ගිණුම්කරණ ඒකකයක ඓතිහාසික ගණුදෙනු හා සිද්ධින් වලට අදාල තොරතුරු අර්ථිකමය තීරණ ගැනීමට සුදුසුආකාරයට සකස්කර මූල්‍ය ප්‍රකාශන මගින් බාහිර පාර්ශව වෙත ඉදිරිපත් කිරීම.


- **කළමනාකරණ ගිණුම්කරණය**

යම්කිසි සංවිධානයක සියළුම කළමණාකරණ මට්ටම් වලට අදාලව සැලසුම් කිරීම, පාලනය කිරීම හා තීරණ ගැනීම යන වගකීම් ක්‍රියාත්මක කිරීමට හැකි අයුරින් මූල්‍ය හා මූල්‍ය නොවන තොරතුරු සැපයීම.

- මූල්‍ය ගිණුම්කරණය හා කළමනාකරණ ගිණුම්කරණය අතර අදුකිය හැකි වෙනස්කම් පහත ශිර්ෂ යටතේ දක්වන්න.
  - තොරතුරු සපයන පාර්ශව
  - තොරතුරු වාර්තා කරන කාලය
  - නෛතික ස්වභාවයන්
  - තොරතුරුවල ස්වභාවය

| ශිර්ෂය | මූල්‍ය ගිණුම්කරණය | කළමනාකරණ ගිණුම්කරණය |
|---|---|---|
| තොරතුරු සපයන පාර්ශව | අභ්‍යන්තර හා හාහිර | අභ්‍යන්තර කළමණාකරුවන්ට |
| තොරතුරු වාර්තා කරන කාලය | වාර්ෂිකව | කළමණාකරණ අවශ්‍යතාවය මත |
| නෛතික ස්වභාවයන් | නෛතික අව්‍යතාවයකි | නෛතික අවශ්‍යතාවයක් නොවේ |
| තොරතුරුවල ස්වභාවය | අතිත මූල්‍යමය | අතීත , වර්තමාන, අනාගත මූල්‍ය හා මූල්‍ය නොවන |

**මූල්‍ය ගිණුම්කරණය හා කළමනාකරණ ගිණුම්කරණය ක්‍රියාවලිය රූප සටහන් ආශ්‍රයෙන් පහත පරිදි දැක්විය හැක**



**(හැදින්වීම අභ්‍යාස අංක 01)**

1. ගිණුම්කරණය යන්න කෙටියෙන් හඳුන්වන්න.

..........................................................................................................................................................

..........................................................................................................................................................

2. ගිණුම්කරණයේ අරමුණු 4 ක් දක්වන්න?

............................................................................ ............................................................................

............................................................................ ............................................................................

3. ව්‍යාපාරය කෙරෙහි උනන්දුවක් දක්වන පාර්ශවයන් 4 ක් නම් කරන්න.

.................................................. ..........................................................................................

.................................................. ..........................................................................................

4. පහත සඳහන් පාර්ශවයන් ව්‍යාපාරය කෙරෙහි ඇල්මක් දැක්වීමට හේතුවක් බැගින් සඳහන් කරන්න. (අ) අයිතිකරු / අයිතිකරුවන් (ආ) බැංකු (ඇ) ණයහිමියන් (ඈ) රජය (ඉ) පාරිභෝගිකයන්

............................................................................ ............................................................................

............................................................................ ............................................................................

............................................................................ ............................................................................

5. ගිණුම්කරණයේ ප්‍රභේද නම් කරන්න.

............................................................................ ............................................................................

6. මූල්‍ය ගිණුම්කරණය යනු කුමක් ද?

..........................................................................................................................................................

..........................................................................................................................................................

7. මූල්‍ය ගිණුම්කරණ ක්‍රියාවලිය නම් කරන්න.

8. කළමනාකරණ ගිණුම්කරණය යනු කුමක් ද?

..........................................................................................................................................................

..........................................................................................................................................................

9. කළමනාකරණ ගිණුම්කරණ ක්‍රියාවලිය නම් කරන්න.

10. මූල්‍යමය ගණුදෙනු හා සිද්ධි හතරක් නම් කරන්න.

..........................................................................................................................................................

11. මූල්‍ය නොවන සිද්ධි දෙකක් ඉදිරිපත් කරන්න.

.......................................................................................................................................................................

12. මූල්‍ය ගිණුම්කරණය හා කළමනාකරණ ගිණුම්කරණය අතර වෙනස්කම් දෙකක් ඉදිරිපත් කරන්න.

...................................................................................................................................................................
...................................................................................................................................................................

**13 පහත සිදුවීම සැලකිල්ලට ගන්න**

- ''Suaranga.com'' ව්‍යාපාරයේ තොරතුරු උචිත ආකාරයකට සිසුන්ට ඉදිරිපත් කරන්න .

රු. 200 000 ක් යොදා මිලින්ද විසින් ''Suranga.com'' නමින් සන්නිවේදන සේවා සපයන ආයතනයක් ආරම්භ කරන ලදී. මෙම ව්‍යාපාරයට අදාළ සියලු තොරතුරු පහත දක්වෙන පරිදි වාර්තා කරයි.

- ණය ගනුදෙනු - ණය පොතක වාර්තා කිරීම
- අත්පිට ගනුදෙනු - කටු මුදල් පොතක වාර්තා කිරීම
- ගනුදෙනුකරුවන්ගේ පෞද්ගලික තොරතුරු වෙනම පොතක වාර්තා කිරීම සිදු කරයි.

වර්ෂ දෙකකට පසවු , ගනුදෙනුකරුවන්ගෙන් ලද ප්‍රතිචාරය අනුව , මිලින්දට ව්‍යාපාරය පුළුල් කිරීමේ අදහසක් ඇති විය. මේ සඳහා රු. 150 000 ක මුල්‍ය අවශ්‍යතාවක් මතු වූ අතර, ඒ සඳහා බැංකු ණයක් ලබා ගැනීමට අදහස් කර ඇත. ණය ලබා ගැනීම සඳහා පසුගිය ආසන්න වසර දෙකක අදාළ ගිණුම් වාර්තා අවශ්‍ය බව බැංකුව දන්වා ඇත.

- 'මෙම සිද්ධියේ ඇතුළත් තොරතුරු ඇසුරින් පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න

අ) මෙම ව්‍යාපාරයේ මූල්‍ය හා මූල්‍ය නොවන සිද්ධි මොනවාද?

ආ) ව්‍යාපාරයට ඇල්මක් දක්වන විවිධ පාර්ශ්වයන් කවුද? එසේ ඇල්මක් දැක්වීමට හේතු මොනවාද


ඉ) ගිණුම්කරණය, මූල්‍ය හා කළමනාකරණ ලෙස වර්ග කිරීමට ගතහැකි උදාහරන මොනවාද?

# ගිණුම්කරණ පරිසරය හැඳීන්වීම

➢ **ගිණුම්කරණ පරිසරය යනු**

**ව්‍යාපාර ආයතනයක ගිණුම්කරණ ක්‍රියාවලිය කෙරෙහි බලපෑම් ඇතිකරන සාධක ගිණුම්කරණ පරිසරය වේ.**

**සංකල්ප සිතියම**



## ගිණුම්කරණ පරිසර සාධක

ගිණුම්කරණ පරිසර සාධක හා ඊට අදාල විචල්‍යයන් රූප සටහන් මගින්

| පරිසරය | සාධකය |
|---|---|
| ආර්ථික හා දේශපාලන පරිසරය |  ශ්‍රී ලංකා මහ බැංකුව CENTRAL BANK OF SRI LANKA |
| තාක්ෂණික පරිසරය | WiFi ZONE  |
| ශිල්පීය හා වෘත්තීය පරිසරය | CA  |
| සමාජ හා සංස්කෘතික පරිසරය |   |
| නෛතික පරිසරය | පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය CONSUMER AFFAIRS AUTHORITY<br>දේශීය ආදායම් දෙපාර්තමේන්තුව - ශ්‍රී ලංකාව Inland Revenue Department - Sri Lanka |

**ව්‍යාපාරයක ගිණුම්කරණ ක්‍රියාවලියට බලපෑම් ඇති කරන ප්‍රධාන පරිසර සාධක හැඳින්වීම හා ඊට අදාල විචල්‍යයන් කීපයක් මෙසේය.**

| පරිසර සාධකය | හැඳින්වීම | විචල්‍යයන් |
|---|---|---|
| 01. ආර්ථික හා දේශපාලන පරිසරය | කිසියම් රජයක් තම ආර්ථික ප්‍රතිපත්ති සැලසුම් කර, ක්‍රියාත්මක කිරීමේ දී ගන්නා තීරණ ආර්ථික හා දේශපාලන පරිසරය ලෙස හැඳින්වේ. | • බදු ප්‍රතිපත්තිය<br>• විනිමය අනුපාත<br>• මිල මට්ටම්<br>• රාජ්‍ය ප්‍රතිපත්ති (පොළී අනුපාත, වැටුප් තීරණ)<br>• වෙළඳපොල තත්ත්වය (මූල්‍ය /ප්‍රාග්ධන) |
| 02. ශිල්පීය හා වෘත්තීය පරිසරය | ගිණුම්කරණ ක්‍රියාවලියේ දී ව්‍යාපාර සම්පත් ප්‍රමාණාත්මකව හා මූල්‍යමය වශයෙන් මැනීම හා තක්සේරු කිරීමට යොදා ගන්නා විවිධ ශිල්පීය ක්‍රම ඇතුළත් පරිසරය ශිල්පීය හා වෘත්තීය පරිසරය වේ. | • ගිණුම්කරණ ප්‍රමිත<br>• ගිණුම්කරණ ශිල්ප ක්‍රම<br>• ගිණුම්කරණ වෘත්තීය ආයතන |
| 03. නෛතික පරිසරය | ව්‍යාපාර විසින් ගිණුම්කරණ ක්‍රියාවලියේ දී අනුගමනය කළ යුතු නෛතික තත්ත්වයන්, නෛතික පරිසරය ලෙස හැඳින්වේ. | • 2007 අංක 07 සමාගම් පනත<br>• 1890 හවුල් ආඥා පනත<br>• දේශීය ආදායම් පනත<br>• ගිණුම්කරණ හා විගණන ප්‍රමිත පනත<br>• ගිණුම්කරණයට අදාළ නඩු තීන්දු |
| 04. සමාජ හා සංස්කෘතික පරිසරය | සමාජයේ සිටින පුද්ගලයින්ගේ සිතුම්, පැතුම් හා ආකල්ප සහිත වටාපිටාව සමාජ හා සංස්කෘතික පරිසරය ලෙස හැඳින්වේ. | • ආකල්ප<br>• සිරිත්-විරිත්<br>• පුරුදු<br>• විශ්වාස<br>• ජන සංඛ්‍යාව<br>• ජන සංක්‍රමණය<br>• පුද්ගල ජීවන රටා |
| 05. තාක්ෂණික පරිසරය | ව්‍යාපාරවල ගිණුම්කරණ කටයුතු පහසු කිරීම සඳහා විවිධ තාක්ෂණික උපකරණ භාවිත කිරීම තාක්ෂණික පරිසරය ලෙස හැඳින්වේ. | • පරිගණක තාක්ෂණය<br>• නව තාක්ෂණික උපකරණ<br>• භාවිතය<br>• සන්නිවේදන තාක්ෂණය |

# ගිණුම්කරණ පරිසර සාධක

### තාක්ෂණික පරිසරය

- පරිගණක තාක්ෂණය
- සන්නිවේදන නව තාක්ෂණය
- නව තාක්ෂණික සොයා ගැනීම්
- ප්‍රාග්ධන ශුක්ෂ්ම ක්‍රම භාවිතය

### ශිල්පීය හා වෘත්තීය පරිසරය

- ගිණුම්කරණ ශිල්ප ක්‍රම
- ක්ෂය කිරීම
- තොග අගය කිරීම
- ගිණුම්කරණ ප්‍රමිත
- ගිණුම්කරණ වෘත්තීය ආයතන

### නෛතික පරිසරය

- හවුල් ව්‍යාපාර ආඥා පනත
- ගිණුම්කරණ හා විගනන ප්‍රමිත පනත
- දේශිය ආදායම් පනත
- පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරී පනත
- ලියාපදිංචි කිරීමේ නීති
- ව්‍යාපාර ඇරඹීමේදී පරිසර අනුකූලතා භාවිතය

### සමාජ හා සංස්කෘතික පරිසරය

- සිරිත් විරිත්
- ආකල්ප
- පුරුදු
- විස්වාස
- ජිවන රටා
- ජන සංඛ්‍යාව
- ජන සංක්‍රමන

### ආර්ථික හා දේශපාලන පරිසරය

- බදු අයකිරීම
- විනිමය අනුපාත නියම කිරීම
- රාජ්‍ය ප්‍රතිපත්ති
- දේශපාලන ව්‍යුහය
- මූල්‍ය හා ප්‍රාග්ධන වෙළඳ පොල තත්වය
- ආර්ථික ව්‍යුහයේ වෙනස්කම්

ගිණුම්කරණ පරිසර සාධක වල වෙනස්වීම ගිණුම්කරණයට සිදුකරන බලපෑම එක් එක් විචල්‍ය යන් ආශ්‍රයෙන් පැහැදිලි කරන්න

| පරිසර සාධකය | විචල්‍ය | බලපෑම |
| --- | --- | --- |
| ආර්ථික හා<br><br>දේශපාලන පරිසරය | 1. එකතුකල අගය මත බදු අයකිරීම | වැට් සම්බන්ධව වෙනම ගිණුම් තැබීම අවශ්‍යවීම ගැනුම් මත වැට් වත්කමක් ලෙසත් විකුනුම් මත වැට් වගකීමත් ලෙසත් ගිණුම් තැබීම |
| | 2. පොළී අනුපාත | පොලී අනුපාතය අඩු කිරීම නිසා<br>බැංකු ණය ලබා ගැනීමට පෙළඹේ. |
| | | අතිරේක ණය ලබා ගැනීම වැඩි වී ව්‍යාපාර වර්ධනයක් ඇති වී ආදායම් වැඩි වේ. |
| නෛතික පරිසරය | 1. 1995 අංක 15 දරණ ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගනන පනත | සිමසහිත පොදු සමාගම් ගිණුම්කරණ කටයුතු වලදී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත භාවිතය |
| | 2. 1890 හවුල් ආඥා පනත | ලිඛිත ගිවිසුමක් නොමැති ව පවත්වා ගෙන ගිය හවුල් ව්‍යාපාරයක ලාභය සම සමව බෙදා ගත යුතු යි. |
| | 3. 2007 අංක 07 සමාගම් පනත | සෑම සීමිත පොදු සමාගමක් ම සමාගම් පනතට අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |
| ශිල්පීය හා වෘත්තීය<br><br>පරිසරය | 1. තොග අගය කිරීම | ප්‍රමිත අංක 02 ට අනුව තොග FIFO හා WAC ක්‍රම පදනම්කර ගැනීම |
| | 2. දේපළ පිරියත හා උපකරණ ගිණුම්කරණ ප්‍රමිතය අනුව ක්ෂය කිරීම | බොහෝ ව්‍යාපාර විවිධ ක්ෂය ක්‍රම අතුරින් සරල මාර්ග ක්ෂය ක්‍රමය භාවිත කිරීම නිසා ගිණුම් තොරතුරුවල ඒකාකාරී බව ආරක්ෂා වීම තුළින් ගුණාත්මක බව වැඩි වීම. |
| සමාජ හා<br><br>සංස්කෘතික පරිසරය | 1. ජන සංක්‍රමන | ජන සංක්‍රමණය ප්‍රදේශවල ජන කණ්ඩායම්වල විවිධතා අනුව නව ව්‍යාපාර අවස්ථා බිහිවීම, ඒවායේ පිරිවැටුම වැඩිවී ලාභය වැඩිවීම |
| | 2. පුද්ගල ජීවන රටා | දේශීය ආහාර ගැනීමේ රටාවට ජනතාව වැඩි නැඹුරුවක් දක්වීම නිසා දේශීය ආහාර වර්ග නිපදවීමේ ව්‍යාපාර වැඩි වශයෙන් ආරම්භ වීම හා එම ව්‍යාපාරවල අලෙවිය වැඩිවීම හා ලාභය වැඩිවීම. |
| තාක්ෂණික පරිසරය | 1. පරිගණක තාක්ෂණය | ගිණුම්කරණ කටයුතු වලදී පරිගණක මෘදුකාංග භාවිතය උදා Excel භාවිතය |
| | 2. නව තාක්ෂණික උපකරණ ගිණුම්කරණය භාවිත කිරීම. | රත්‍රන් අලෙවි කිරීමේදී ''ඩෙන්සි මීටරය '' භාවිත කිරීම නිසා ව්‍යාපාරවල සිදුවිය හැකි වංචා අවම වී ආදායම් ඉහළ යාම. |

# ගිණුම්කරණයේ නව ප්‍රවණතා

තිරසාර සංවර්ධන අරමුණු ඉටුකර ගැනීම පදනම්ව ගිණුම්කරණ ක්ෂේත්‍රයේ දැනට භාවිතවන ප්‍රවනතා

1. හරිත ගිණුම්කරණය


පරිසර සංරක්ෂනය හා සුරක්ෂිතතාවය සම්බන්ධයෙන් ව්‍යාපාර ගෙන ඇති ක්‍රියාමාර්ග හා අනුගමනය කිරීමට අපේක්ෂිත ක්‍රියාමාර්ග මූල්‍ය ප්‍රකාශන තුලින් අනාවරණය කිරීම

2. සමාජ වගකීම් ගිණුම්කරණය

ව්‍යාපාර විසින් තම අරමුණු ඉටුකර ගැනීමේදී උපයන ලාභයෙන් යම් ප්‍රමාණයක් සමාජ උන්නතිය උදෙසා හා යහ පැවැත්ම උදෙසා වැය කලයුතු බවයි

උදා රෝහල් වාට්ටු ඉදි කිරීම, වෛද්‍ය උපකරණ ලබාදීම, නොමිලේ ඇස් කණ්නාඩි ලබාදීම

ගිණුම්කරණ පරිසරයට අදාලව එක්එක් පරිසර සාධක වලට අදාල විචල්‍යයන් හිස්තැන්වල ලියන්න




**පරිසර සාධක වර්ගීකරණය**


1. විනිමය අනුපාත
2. ගිණුම්කරණ ප්‍රමිත
3. නව තාක්ෂණික උපකරණ
4. බදු ප්‍රතිපත්තිය
5. පරිගණක තාක්ෂණය
6. සමාගම් පනත
7. මිල මට්ටම
8. සන්නිවේදන තාක්ෂණය
9. හවුල් ආඥා පනත
10. ජන සංක්‍රමණය
11. ගිණුම්කරණ වෘත්තීය ආයතන
12. පුද්ගල ජීවන රටා

## පාඩමට අදාල මූලික පද

| **මූලික පද** | **Key terms** |
|---|---|
| ඇල්මැති පාර්ශ්වයන් | Stake holders |
| මූල්‍ය ගිණුම්කරණය | Financial Accounting |
| කළමනාකරණ ගිණුම්කරණය | Management Accounting |
| ගිණුම්කරණයේ අරමුණ | Objective of Accounting |
| ගිණුම්කරණයේ ප්‍රභේද | Branches of Accounting |
| ගිණුම්කරණ යෙදවුම් | Accounting Inputs |
| ගිණුම්කරණ නිමවුම් | Accounting Outputs |
| ගිණුම්කරණ ක්‍රියාවලිය | Accounting Process |

ගිණුම්කරණ ක්‍රියාවලිය තවදුරටත් පහත රූප සටහනට අනුව දැක්විය හැක

**සංකල්ප සිතියම**



## ගිණුම්කරණය ක්‍රියාවලියක් බව හඳුනා ගනිමු

**ඕනෑම ක්‍රියාවලියක පහත සිදුවීම් දැකිය හැක**





නිදසුන් ලෙස බේකරියක ක්‍රියාවලිය සලකා බලමු

1) යෙදවුම් ලෙස - පිටි, ඊස්ට්, ලුනු, සීනි ආදී අමුද්‍රව්‍ය

2) ක්‍රියාවලිය - පිටි, ඊස්ට්, ලුනු, සීනි ආදී ද්‍රව්‍ය පදමට කලවම්කර අවශ්‍ය ප්‍රමාණයන්ට වෙන් කිරීම පෝරනුවක හෝ අවන් එකක දමා පිළිස්සීම

3) නිමවුම - පාන් , බනිස්, වියන් රෝල් ආදිය

**මෙම ක්‍රියාවලියම ගිණුම්කරනයේදීද සිදුවේ එයිදී ක්‍රියාවලිය පමණක් පහත රූපසටහනින් හඳුනා ගනිමු**



ගිණුම්කරණ නිමැවුම් වන මූල්‍ය ප්‍රකාශන බිහිකරලීමට 'පදනම්' වශයෙන් භාවිත කරන දෑ ගිණුම්කරණ යෙදවුම් ය. ඒවා **ගනුදෙනු හා සිද්ධි** වේ.

- ගිණුම්කරණ යෙදවුම්වලට අදාළ තොරතුරු සටහන් කෙරෙන මූලාශ්‍ර ලේඛන, මුලින් ම සැලකිල්ලට ගත යුතු ය.

ව්‍යාපාරයක සිදුවන ගනුනෙු වලට අදාල මූලාශ්‍ර ලේකන හඳුනා ගනිමු

| | | |
|---|---|---|
| **මුදල් ලැබීමේ දී** | - | **ලදුපත** |
| **මුදල් ගෙවීමේ දී** | - | **වවුචරය** |
| **ණයට භාණ්ඩ ගැනිම** | - | **ගැනුම් ඉන්වොයිසිය** |
| **ණයට භාණ්ඩ විකිනීම** | - | **විකුණුම් ඉන්වොයිසිය** |
| **ණයට ගත් භාණ්ඩ ආපසු යැවීම** | - | **හර පත** |
| **ණයට විකුණු භාණ්ඩ ආපසු එවීම** | - | **බැර පත** |
| සුළු වියදම් ගෙවීම් | - | සුළු මුදල් වව්චර් |

**ඉහත දැක්වූ ගණුදෙනු වලට අමතරව වන ඕනෑම ගණුදෙනුවක් - ජ නල් වව්චර්**

- **දෙපාර්ශ්වයක් අතර, හුවමාරුවක් සිදු වන මුදලින් මැනිය හැකි දෑ ගනුදෙනු වේ.**

නිද : • විකිණීම සඳහා රු. 30,000 භාණ්ඩ තොගයක් මිල දී ගැනීම

- බැංකුවෙන් රු. 50,000 ක ණය මුදලක් ලබා ගැනීම
- සේවක වැටුප් රු. 10,000 ගෙවීම

මෙම ගනුදෙනු නිසා ව්‍යාපාරයේ **වත්කම්, හිමිකම් හා වගකීම්වල** මූල්‍යමය ලෙස වෙනස්වීම් සිදු වේ.

දෙපාර්ශ්වයක් අතර හුවමාරුවක් සිදු නොවුව ද, **ව්‍යාපාරයේ වත්කම්, වගකීම්, හිමිකම්** කෙරෙහි බලපෑමක් ඇති වන මුදලින් මැනිය හැකි දෑ **'සිද්ධි'** වේ.

උදා :

- යන්ත්‍ර, ලී බඩු ආදී වත්කම් භාවිතයත් සමග ක්ෂය වීම (අගය අඩු වීම)
- භාණ්ඩ තොග විනාශයට පත් විම

**ගිණුම්කරණ ක්‍රියාවලිය පියවර ලෙස දක් වූ විට පහත පරිදි වේ.**

1 - ව්‍යාපාරයක ගනුදෙනු හා සිද්ධීන්වල වටිනාකම 'මුදල්' මාධ්‍යයෙන් මැනීම

2 - මූලාශ්‍ර ලේඛන පදනම් කර ගෙන මූලික සටහන් පොත්වල වාර්තා කිරීම

3 - මූලික සටහන් පොත්වල ඇතුළත් කළ දෑ ලෙජරයට පිටපත් කිරීම

4 - ලෙජර් ගිණුම් තුලනය කර, ශේෂ පිරික්සුමක් පිළියෙල කිරීම

5 - මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම

• **ගිණුම්කරණ නිමැවුම් යනු ආර්ථිකමය තීරණ ගැනීමට හැකි වන පරිදි ගිණුම්කරණ ක්‍රියාවලිය තුළින් බිහි කරන මූල්‍ය ප්‍රකාශන වේ. මීට අයත් වන්නේ.**

• කාලච්ඡේදයේ ලාභ හා අලාභ පෙන්නුම් කෙරෙන **ආදායම් ප්‍රකාශනය / ලාභ හෝ අලාභ ප්‍රකාශනය**

• නිශ්චිත දිනකට පවතින වත්කම්, වගකීම් හා හිමිකම්වල පවතින තත්ත්වය පෙන්නුම් කෙරෙන **මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය**

• හිමිකමේ සිදු වන වෙනස්වීම් පෙන්නුම් කෙරෙන **හිමිකම් වෙනස්වීම් ප්‍රකාශනය**

• කාලච්ඡේදය තුළ මුදල් ගලා ඒම් හා මුදල් ගලා යෑම් වෙනස්වීම් පෙන්නුම් කෙරෙන **මුදල් ප්‍රවාහ ප්‍රකාශනය.**

**(හැදින්වීම අභ්‍යාස අංක 02)**

(1) පහත සඳහන් ගනුදෙනුවලට අදාළ තොරතුරු සටහන් වී ඇති මූලාශ්‍ර ලේඛන නම් කිරීම.

1 - අත්පිට විකුණුම් රු. 25 000 කි.

2 - රක්ෂණ ගාස්තු ගෙවීම් රු. 4 000

3 - විකිණීම සඳහා රු. 45 000ක තොගයක් අමල්ගේ ව්‍යාපාරයෙන් ලබා ගැනීම.

4 - අමල්ගේ ව්‍යාපාරයට රු. 2 000 ක බඩු තොගයක් ඉල්ලූ වර්ගයට වඩා වෙනස්වීම මත හරවා යැවීම.

(2) ඉහත (1) හි දැක්වෙන ගනුදෙනු සටහන් කිරීමේ දී යොදා ගන්නා මූලික පොත් නම් කිරීම.

(3) ගිණුම්කරණ ක්‍රියාවලියේ පියවර අනුපිළිවෙලින් සටහන් කිරීම.

(4) පහත සඳහන් දෑ ලබා ගැනීමට පිළියෙල කරන මූල්‍ය ප්‍රකාශන නම් කිරීම.

(අ) කාලච්ඡේදයේ ලාභය

(ආ) වත්කම්, වගකීම් හා හිමිකම්වල තත්ත්වය

(ඇ) මූල්‍ය තත්ත්වය වෙනස්වීම්